# මධ්‍ය ම පළාත් අධ්‍යායපන දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකා ගුරු සේවයේ

# වාර්ෂික ස්ථානමාරු - 2025

1. මධ්‍යනම පළාත් සභාවට අයත් පාසල්වල සේවය කරන ගුරුභවතුන්ගෙන් 2025 වර්ෂය සඳහා ගුරු සේවයේ ස්ථානමාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

2. සියලුම ඉල්ලුම්පත්‍රප පළාත් අධ්‍යාවපන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මෙම දැන්වීම පළවීමෙන් පසු,

   I. කලාපය තුළ හා අන්තර් කලාප අයදුම්පත් මෙම වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත ක්‍රීමය (Online) හරහා **2024 අගෝස්තු මස 10** දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

   II. අන්තර් පළාත් අයදුම්පත් ලිඛිතව **2024 අගෝස්තු මස 10 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ විදුහල්පති මඟින් කලාප අධ්‍යා)පන අධ්‍ය0ක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ස්ථානමාරු ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී,

   I. කලාපය තුළ ස්ථානමාරු හා අන්තර් කලාප ස්ථානමාරු සඳහා (www.centralprovinceedu.lk) මෙම වෙබ් අඩවිය හරහා පමණක් ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. (ඉල්ලුම්පත්‍ර් පිරවීමේ දි ඔබ කැමති අන්තර්ජාල පහසුකම් ඇති ස්ථානයකින් ඉල්ලුම්පත් ( Online) ඉදිරිපත් කළ හැකි අතර, ඒ සඳහා තාක්ෂණික විද්‍යාඉගාර හා ප්‍රා දේශීය පරිගණක සම්පත් මධ්‍යීස්ථාන ( CRC) හරහා අන්තර්ජාලය භාවිත කිරීමට පහසුකම් සලස්වා ඇත.)

   II. අන්තර් පළාත් සඳහා ඉල්ලුම් කිරීමේ දී මධ්‍යඇම පළාත් අධ්‍යා පන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති 2025 වර්ෂයට අදාළ ඉල්ලුම්පත්‍රතය පමණක් භාවිත කළ යුතුය. (අදාළ ඉල්ලුම්පත්‍රව මධ්‍යමම පළාතේ ළඟම පිහිටි කලාප අධ්‍යාතපන කාර්යාලයෙන් ලබා ගත හැකිය.)

   III. අන්තර් පළාත් සඳහා ඉල්ලුම්පත්‍රු පිටපත් 05 ක් අවශ්‍යි වේ.

   IV. ජාතික පාසල් සේවයෙන් පළාත් රාජ්‍ය සේවයට ස්ථාන මාරු ඉල්ලුම්පත්‍ර් ජාතික පාසල් අධ්‍යතක්ෂවරයා විසින් නියම කරන කාලවකවානුවේ දී ඒ සඳහා නිකුත් කරන ඉල්ලුම්පත්‍රියක් මඟින් ඉදිරිපත් කළ යුතුය.

   V. අන්තර් පළාත් ගුරු සේවයේ ස්ථාන මාරු සඳහා පළාත් අධ්‍යාඳපන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ගුරු සේවයේ ස්ථාන මාරු පිටුවේ සඳහන් කර ඇති පොදු නිර්ණායක පදනම් කරගෙන ඒ අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුවේ.

04. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රු හා මධ්‍යනම පළාත් අධ්‍යා්පන දෙපාර්තමේන්තුවෙන් 2025 වර්ෂයට අදාළව නිකුත් කර ඇති ඉල්ලුම්පත්‍රවවලට පරිබාහිරව භාවිතා කර ඇති

ඉල්ලුම්පත්‍රව හා නියමිත දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත්‍රව ප්‍රතික්ෂේප කරන බව විශේෂයෙන් සැලකිය යුතුය.(A4 ප්‍රමාණයේ පිටු 04 කින් සකස් කර ඇත.)

- අන්තර් කලාප හා කලාපය තුළ ස්ථානමාරු අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම අන්තර්ජාලය හරහා අදාල කලාප කාර්යාල හා පළාත් අධ්‍යාපන කාර්යාලය මඟින් සිදුකෙරේ.

**05.** චක්‍ර ලේඛ අංක ඊඩී/1/27/1/5/1/2007, 2007/20 හා 2007.12.13 දාතමින් නිකුත් කර ඇති ජාතික ගුරු මාරු චක්‍ර ලේඛය හා ජාතික ගුරු මාරු චක්‍ර5ලේඛයට අනුකූලව සකස් කරන ලදුව මධ්‍ය ම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.06.04 දින සිට අනුමත කරන ලද මධ්‍යයම පළාත් ගුරුමාරු ප්‍රතිපත්තිය අනුව 2025 වර්ෂයේ ගුරු සේවයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කරනු ලැබේ.

**06.** මධ්‍යම පළාතේ ගුරුමාරු සිදුකිරීම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සිදු කෙරේ.

I. ස්ථානමාරු අයදුම්පත්‍රළ ඉදිරිපත් කිරීමේ දී සේවා කාලය ගණනය කරනු ලබන්නේ 2024.01.01 දිනටය.

II. මුල්පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි කාල සීමාවෙන් 2024.01.01 දින වන විට අවුරුදු 05 ක් සම්පූර්ණ කරන ලද ගුරුවරුන් ස්ථාන මාරුවීම් සඳහා හිමිකම් ලබයි.

III. විනය හේතු මත ස්ථානමාරු කර ඇති ගුරුභවතුන් ස්ථානමාරු සඳහා සුදුසුකම් නොලබනු ඇත.

IV. අන්තර් පළාත් ස්ථානමාරු සඳහා මධ්‍යරම පළාත තුළ අවම වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

V. 2024 වර්ෂයට අදාළව ඉල්ලුම් කරන ලද සියළුම ගුරුමාරු අයදුම්පත්‍ර 2025 වර්ෂයට අදාළ අයදුම්පත්‍රඅ කැඳවීම ආරම්භවීමත් සමඟ අහෝසි කරනු ලැබේ.

**07.** පාසලට අතිරික්තව සිටින සහ වසර 08 කට වැඩි සේවා කාලයක් එකම පාසලේ සේවය කර ඇති ගුරුභවතුන් ස්ථානමාරු ඉල්ලීම් නොකළද සේවා අවශ්‍යතාවය මත ස්ථානමාරුවීම්වලට යටත් වේ.

**08.** ස්ථානමාරු අයදුම්පත් අන්තර්ජාලයට ඇතුලත් කළ පසු අයදුම්කරු සඳහා ලියාපදිංචි අංකයක් ලැබේ. ස්ථාන මාරු සම්බන්ධව විමසීම් කිරීමේදී මෙම අංකය ඉදිරිපත් කළ යුතුවේ.

**09.** අන්තර් පළාත් ස්ථානමාරු අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යසක්ෂ මඟින් මධ්‍යම පළාත් අධ්‍ය පන අධ්‍යාක්ෂ වෙත ඉදිරිපත් කළ පසු එම අයදුම්පත්‍රා පළාත් අධ්‍යාමපන ලේකම් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

**<u>අන්තර් කලාප ගුරු ස්ථාන මාරු අයදුම්පත්‍රභය මාර්ගගතව( ONLINE) පිරවීමේදී පහත කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමුකළ යුතුය.</u>**

1.අයදුම්පත කො ටස් දෙකකින් සමන්විත වේ. එසේම පළමු පත්වීම් ලද පාසලේ තොරතුරු යොමු කිරීම සඳහා පිටුවක් ද ඇතුලත් කොට ඇත.

2. ඒ අනුව අයදුම්පත සම්පූර්ණ වීම සඳහා PART 1 / PART 2 / සහ පළමු පත්වීම් ලිපියෙහි මෘදු පිටපත යොමුවිය යුතුය. [SUBMIT]

3.මධ්‍යම පළාත් නව ගුරුමාරු ප්‍ර[තිපත්තියට අනුව ඔබගේ පෙර සේවා කාලය සලකා ඔබට ලකුණු හිමිවන අතර, එම ලකුණු අනුව ඔබගේ මාරුවීම ප්‍රමුඛතා ගත වනු ඇත.

4.අයදුම්පතෙහි පළමු කොටස මගින් ඔබගේ මූලික තොරතුරු රැස් කෙරෙන අතර , දෙවන කොටසින් පෙර සේවා විස්තර රැස්කරගනී. පෙර සේවා විස්තර අනුව ඔබට ලකුණු හිමිවන බැවින් , ස්ථානමාරුව ලබාගැනීම සඳහා අයදුම්පතෙහි දෙවන කොටස අනිවාර්යයෙන්ම නිවැරදිව සම්පූර්ණ කොට යොමු [ submit] කළ යුතුය. [මධ්‍යරම පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය අධ්‍යකයනය කරන්න.]

5.පළමු කොටස සම්පූර්ණ කොට යොමු [ submit] කිරීමත් සමගම ඔබගේ අයදුම්පතෙහි PDF පිටපතක් ඔබට ලැබෙනු ඇත. එය මුද්‍රසණය කොට සුරැකිව තබාගන්න

6.පදිංචි ස්ථානයේ සිට දුර ගණනය කිරීම සඳහා GPS coordinates අවැසිවන අතර google map භාවිතයෙන් ඔබට සොයාගත හැක . මෙය අත්‍යාවශ්‍ය වන අතර එය සම්පූර්ණ නොකිරීම ලකුණු ගණනයේදී අවාසියක් වීමට හේතු විය හැක.

7.අයදුම්පත පිරවීම සඳහා පරිගණකයක් භාවිතා කිරීම මගින් සිදුවිය හැකි වැරදි අඩුපාඩු අවම කරගත හැක.

එම්.ජී.අමරසිරි පියදාස
මධ්‍යාම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ